# ස්ත්‍රී-පුරුෂ සමාජභාවී දැක්මකින් යුතු රජයේ අයවැය සම්පාදනය......





## 2008 ශ්‍රී ලංකා රජයේ අයවැය දෙස ස්ත්‍රී පුරුෂ දෘෂ්ටියකින්

### හැඳින්වීම

විවිධ ස්ත්‍රී පුරුෂ කණ්ඩායම් අතර ජීවන තත්ත්වය නඟා සිටුවීමට හෝ පහත හෙළීමට වැඩිම බලපෑමක් කළ හැකි ප්‍රතිපත්ති මෙවලම ලෙස ජාතික අයවැය හඳුන්වා දිය හැකිය. මෙහිදී ජාතික අයවැය සම්පත් පරිභෝජනය, ආදායම් ඉපයීම, අධ්‍යාපනය සහ පුහුණුවීම්, සෞඛ්‍ය සහ පෝෂණය, සේවා නියුක්තිය සහ තීරණ ගැනීම යන කරුණු වලට අදාලව, ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර ඇති පරතරය අඩු වැඩි කිරීමට යොදා ගතහැකි මෙවලමකි. (1) ගැහැනුන් හා පිරිමින් ද, එසේ ම ගැහැනු දරුවන් හා පිරිමි දරුවන් ද වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් කැරෙන වියදම් (2) ගැහැනුන් වෙනුවෙන් ම විශේෂිත යෝජනා ක්‍රම සඳහා වූ වියදම් (3) ගැහැනුන් හා පිරිමින් විෂයෙහි වෙන් වෙන්ව බලපාන්නා වූ ප්‍රධාන ධාරාවෙහි වියදම් යන තුන් ආකාරයක රාජ්‍ය වියදම්, ස්ත්‍රී පුරුෂ සංවේදිතාවක් සහිත අයවැයක් තුළ දැකිය හැකි වන්නේ ය.

ප්‍රධාන රාජ්‍ය ආයතනයන් හෝ ප්‍රාදේශීය ආයතනයන් වෙතින් ස්ත්‍රී පුරුෂ පදනමින් යුත් දත්ත සොයාගත නොහැකි වීම ස්ත්‍රී පුරුෂ දෘෂ්ටියකින් යුතුව ජාතික අයවැය විශ්ලේෂණය කිරීම ඉදිරියෙහි ඇති ප්‍රබල බාධාවකි.

2007/2008 අයවැයෙහි 11% කට මඳක් වැඩි ප්‍රමාණයක් වශයෙන් දැක්වෙන අධ්‍යාපන සෞඛ්‍ය හා කෘෂිකර්ම යන අමාත්‍යංශයන් හි පුනරාවර්තන වියදම් විෂයෙහි මෙම විමර්ෂණයේ දී සැලකිල්ල යොමු වෙයි. මාතෘ හා දාරක ආරක්ෂණය, පිරිවෙන් අධ්‍යාපනය, බාල දක්ෂ සංවිධාන ආදී විෂයයන්ට පමණක් සීමා වූ වෙන්කිරීම් හැරුණු විට සමස්තයක් වශයෙන් ම මෙම අයවැයෙහි දක්නට ඇත්තේ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ම දෙස පොදුවේ බැලෙන ස්වභාවයකි.

### 2.. නිරීක්ෂණ සම්පිණ්ඩනය

### 2.1 අධ්‍යාපන අමාත්‍යංශය

රජයේ ශුභසාධන ප්‍රතිපත්තිය පිළිබිඹු කැරෙන සේ සංශෝධිත මිලියන 20071 කට මඳක් වැඩි වූ අධ්‍යාපන අමාතංශයේ 2007 වර්ෂය සඳහා අයවැය වියදම රජයේ සමස්ත පුනරාවර්තන වියදම්වලින් 3.2%ක් වී ය. 2008 සඳහා මිලියන 20358 ක් වන ලෙස දැක්වෙන එය සමස්ත පුනරාවර්තන වියදම්වලින් 3% කි.

2007 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යංශ අයවැයෙන් 93% කට ආසන්න ප්‍රමාණයක ම අන්තර්ගත වූයේ පුද්ගල වැටුප් (54%) සහ ප්‍රදානයන් (39%) ය. 2008 දී වෙනත් දීමනා (6%)ද නව බඳවාගැනීම් (1%) ද එයට එකතු වී ය. ශුභසාධන ආකල්පයකින් යුතුව වෙන් කරන ලද මෙකී වියදම්වල සැලසුම් සහගත බවක් හෝ ඉලක්කයක් හෝ නොවුණු අතර ඒ හේතු නිසාම ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය පිළිබඳ අරමුණ ද ඉටු වී තුබුණු බවක් නොපෙනිණ. කාන්තාවන් උදෙසා සේවා අංශයෙහි රැකියා උත්පාදනය කිරීම සම්බන්ධයෙන් වැදගත් ස්ථානයක් කලක සිට ම අධ්‍යාපන අමාත්‍යංශයට තිබිණි. දැනට ද සේවා අංශයෙහි රැකියා ප්‍රමාණයෙන් 8% ක් ම (සමස්ත කාන්තා රැකියා ප්‍රමාණයෙන් 35% කි.) වෙන් වන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිරත කාන්තාවන්ට ය.

අධ්‍යාපන අමාත්‍යංශයේ සේවක වැටුප් ගෙවීම් සඳහා මුදල් වෙන් කරනු ලැබ ඇත්තේ මධ්‍යම රජයට සම්බන්ධව සිටිමින් නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් සේවා සපයන නිලධාරීන් 41543 ක් වෙනුවෙන් ය. එයින් 40743 ක් ම අධ්‍යාපන අමාත්‍යංශයේ නිලධාරීන් වෙති. එයින් ද 59% ක් ම කාන්තාවන් ය. අගැයීම් සහ විභාග දෙපාර්තමේන්තුවට සම්බන්ධ නිලධාරීහු 565 දෙනෙකි. එයින් 33.6% ක් කාන්තාවන් ය. ආයතන සේවා දෙපාර්තමේන්තුවට සම්බන්ධ නිලධාරීන් 235 කි. එයින් 37% කට කට ආසන්න ප්‍රමාණයක් කාන්තාවන් ය.

**අධ්‍යාපන අමාත්‍යංශයේ ද එසේ ම විභාග සහ ප්‍රකාශන දෙපාර්තමේනතුවේ ද තීරණ ගන්නා මට්ටම්වල කාන්තා නියෝජනය බෙහෙවින් අඩු මට්ටමක පවතී. එම දෙපාර්තමේන්තු තුනෙහි ම වඩාත් ඉහළ තනතුරු හොබවන කාන්තාවන් ඇත්තේ ම නැත**. අධාපන අමාත්‍යංශයෙහි නිරැතියන්ගෙන් සියයට දෙකක් ජ්‍යෙෂ්ඨ මට්ටමෙහි ලා සැලකෙන අතර එයින් 26% කට ආසන්න ප්‍රමාණයක් කාන්තාවන් ය. ද්වීතීය මට්ටමේ සේවකයන් වූ 83% න් 54% ක් කාන්තාවන් වූ අතර ප්‍රාථමික මට්ටමෙහි ලා සැලකුණු 11% න් යටත් පිරිසෙයින් තුනෙන් එකක්වත් කාන්තාවන් වෙති. අනියම් සේවක ගණයට වැටෙන්නෝ මුළු සේවක ප්‍රමාණයෙන් සියයට එකකි. ඉන් 32% ක් ම කානතාවන් ය. ආසන්න ප්‍රමාණයක් කාන්තාවන් ය.

සංවාද
SANVADA
சம்வாதம்

pathfinder Foundation

'POLICY BRIEF 11'

## ප්‍රදානයන්

ප්‍රදානයන් ගෙන් අඩකට වඩා (10.3%)වෙන් කරනු ලැබ තිබෙන්නේ රාජ්‍ය සේවකයන් වෙත ප්‍රදානය කරනු ලැබ ඇති දේපොළ ණය වෙනුවෙන් ය. ශුභසාධන අයවැයෙන් යටත් පිරිසෙයින් 24% ක් ම මෙන් ප්‍රාථමික පන්තිවල ශිෂ්‍යයන් වෙත භේදයකින් තොරව ලබා දෙන මිලියන 7 න් වූ පාඩම් පොත් වැනි ප්‍රදානයන් ය. **සෑම පළාතක ම පාසැල්වල ශිෂ්‍ය ප්‍රමාණයන් හි ගැහැනු ළමයින් ගේ සංයුතිය පිරිමි ළමයිනට වඩා අඩු ය. ඒ අනුව ප්‍රාථමික පන්තිවල දී නොමිලේ ලැබෙන පොත් වැඩිපුර පරිශීලනය කරන්නෝ පිරිමි ය.** පිරිවෙන් ශිෂ්‍යයන් ද ඇතුළු ද්විතීය මට්ටමෙහි ශිෂ්‍යයන් අතර පෙළ පොත් මිලියන 20 ක් බෙදා දෙනු ලැබ තිබේ. පළාත් පහක (බස්නාහිර, දකුණු, උතුරු මැද සහ වයඹ) ද්විතීය මට්ටමේ පාසැල්වල වඩා හොඳින් මෙම සහනය බුක්ති විඳින ලද්දේ ගැහැනු දරුවන් විසින් ය. එම පළාත්වල පාසැල් යන පිරිමි දරුවෝ ගැහැනු දරුවනට වඩා ප්‍රමාණයෙන් අඩු වීම එයට හේතුවයි.

**පස් වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර** හැටියට වෙන් කරන ලද රුපියල් මිලියන 275 ක මුදල ප්‍රදානයන් ගෙන් 3.5% කි. සෑම පළාතක ම ශිෂ්‍යාවෝ ශිෂ්‍යයනට වඩා ඉහළ තත්ත්වයක් ප්‍රදර්ශනය කරමින් මෙම වෙන් කිරීමෙහි හොඳ ම ප්‍රතිලාභීන් වී සිටිති. **භේදයකින් තොරව සෑම පාසැල් ශිෂ්‍යයකු ම (දරුවන් දැරියන් සහ පැවිද්දන් ) වෙත නොමිලේ බෙදා හැරෙන පාසැල් ඇඳුම්** වනාහි තවත් එබඳු ම වූ ප්‍රදානයකි.

**නොමිලේ පෝෂණය ලබාදීම** - ආදායම රුපියල් 2500 නොඉක්මවන පවුල්වලට අයත් 1 වනි හා 2 වැන ශ්‍රේණිවල දරුවන් සඳහා දැනට මෙම පහසුකම ප්‍රදානය කෙරෙයි. පාසැල්වලට ගැහැනු දරුවන් ඇතුළත් වීමේ ප්‍රමාණය අඩු බැවින් මෙම පහසුකම වැඩිපුර භුක්ති විඳින්නේ පිරිමි දරුවන් ය. 1 වැනි හා 2 වැනි ශ්‍රේණිවල ගැහැනු දරුවන් ගේ ප්‍රතිශතය 49% කි.

විශේෂ අධ්‍යාපනය (ආගමික අධ්‍යාපනය සහ ආබාධිතයන් සඳහා අධ්‍යාපනය) විශේෂ අධ්‍යාපනය සඳහා වෙන් කැරුණු මුදලින් විශාලතම කොටසින් 17% ක් යෙවෙන්නේ මුළුමනින් ම පිරිමින් වන බෞද්ධ පැවිදි පක්ෂයේ අධ්‍යාපනය වෙනුවෙන් පිරිවෙන් සඳහාය. අයවැයෙහි ප්‍රදානයන්ගෙන් සියයට එකකට අඩු ප්‍රමාණයක් (0.56) රජයේ පාසැල්වල 930 දෙනෙක් සේවයෙහි යෙදෙන විශේෂ ඒකකයන් හි 9260 ක් වූ ආබාධිත ශිෂ්‍යයන් වෙනුවෙන් යෙදැවේ. ආබාධිතයන් සඳහා වූ පාසැල් 25 ක් පමණ ක්‍රියාත්මක ය.

විවිධ ආකාරයේ ආබාධයන් සහිත දරුවෝ 20345 ක් සිටිති. මෙයින් අන්ධ හා වෙනත් දෘෂ්‍යාබාධයන් ගෙන් පෙළෙන ගැහැනු දරුවන් ගෙන් 54.1% කට ආසන්න ප්‍රමාණයක් දකුණු සහ ඌව පළාත්වල වෙසෙති. හඳුනාගනු ලැබ තිබෙන අනෙක් සෑම ආකාරයක ම ආබාධිත දරුවන් ගෙන් වැඩි ප්‍රතිශතයක් සමන්විත වන්නේ පිරිමි දරුවන් ගෙන් ය. මානසික ආබාධයන් ගෙන් මෙන් ම මොන්ගෝල ස්වභාවයෙන් ද එසේ ම ස්වේච්ඡතා ආබාධයෙන් (Autism) ද පෙළෙන දරුවන් විශාල ප්‍රමාණයක් දකුණු සහ ඌව පළාත්වලින් සොයාගනු ලැබ තිබේ. එසේ ම ඉගෙනීමේ දුෂ්කරතා සහිත දරුවන් ගෙන් වැඩි ප්‍රතිශතයක් සොයාගනු ලැබ තිබෙන්නේ උතුරු නැගෙනහිර සහ ඌව පළාත්වලින් ය. බස්නාහිර පළාත හැරුණුකොට ගැහැනු දරුවන් ගෙන් වැඩි කොටසක් සුවිශේෂී ආබාධයන් සහිත වූවන් ගේ ගණයෙහි ලා සලකනු ලැබ නැත.

ගුරු වෘත්තියට ඇතුළත් වන උපාධි නොලත් අය වෙත පූර්ව ගුරු සේවා අධ්‍යාපනයක් ලබා දීම ජාතික අධ්‍යාපන මධ්‍යස්ථානයන් හි දී සිදු වෙයි. මුළු වෙන් කිරීම්වලින් 0.05% ක් මෙවැනි මධ්‍යස්ථාන 18 ක සේවකයන් ගේ වැටුප් සහ වෙනත් වියදම් සඳහා ද 0.01% ක් ගුරු අභ්‍යාස විද්‍යාලයන් හි සේවකයන් 1006 ක් වෙත ගෙවීම සඳහා ද යෙදැවෙයි. සේවයෙහි යෙදෙන කාන්තාවන් ගේ ප්‍රමාණය අඩු මට්ටමක පවතින්නේ ගුරු අභ්‍යාස විද්‍යාල නවයෙන් දෙකක පමණි.

## සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යංශය

ශුභසාධනයට ප්‍රමුඛ තැනක් දීමේ රජයේ වැඩ පිළිවෙළෙහි ප්‍රධාන අංගයක් වූ 2007 වර්ෂයේ සමස්ත පුනරාවර්තන වියදම්වලින් 6.1% ක් සේ සැලැකෙන සෞඛ්‍ය අමාත්‍යංශයෙහි සමස්ත පුනරාවර්තන වියදම රුපියල් මිලියන 36322 ක් වේ. වර්ෂයේ පුනරාවර්තන වියදම්වලින් 5.5% ක් වන සේ එය 2008 දී 40200 දක්වා ඉහළ නැංවීමට අදහස් කරනු ලැබේ. **සෞඛ්‍ය සේවාවන් හි පඩිනඩි (52%) ද නොමිලේ සැපැයෙන බෙහෙත් ආදිය (33%) ද වෙනත් ප්‍රදානයන් (8%) ද සඳහා සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යංශයෙහි සමස්ත අයවැයෙන් 93%** ක් වෙන් කරනු ලැබ තිබේ. පරිපාලකයන් සහ විශේෂඥයන් ඇතුළු වෛද්‍ය නිලධාරීන් 9656 ක් ඉක්මවන ප්‍රමාණයක් මෙම අමාත්‍යංශයට සම්බන්ධව සේවයෙහි යෙදෙති. තීරණ ගන්නා මට්ටම්වල එනම් ජ්‍යෙෂ්ඨ තනතුරුවල කාන්තාවන් යොදවනු ලැබ තිබෙන්නේ 25% ට මඳක් වැඩි සංඛ්‍යාවක් පමණි. විවිධ දෙපාර්තමේන්තුවල වුව ද තීරණ ගන්නා මට්ටම්වල නිරත වන අයගේ ප්‍රමාණය සමස්ත සෙවක සංඛ්‍යාවෙන් 5% කට අඩු ය.

සමස්ත වෙන් කිරීම්වලින් සියයට 18 කට ආසන්න ප්‍රමාණයක් පරිපාලනයට හා කළමනාකරණයටත් මානව සම්පත් සංවර්ධනයටත් යෙදවෙයි. කාන්තාවන් ගෙන් වැඩි පිරිසක් සම්බන්ධ වී සිටින්නේ **පරිපාලන හා ආයතනික සේවාවන් හි සහ ජාතික ඖෂධ තත්ත්ව පාලන ඒකකයෙහි ය.**

සෞඛ්‍ය සේවා ප්‍රතිලාභ අවශ්‍යතා නිර්ණයෙහි ලා වැදගත් වන පරාමිතියක් වූ උපතේ දී කෙරෙන ජීවිත කාල නිර්ණයන් තුළින් පැහැදිලි වන්නේ **76.8 ක් වූ ගැහැනු ජීවිත කාලයට වඩා පිරිමි ජීවිත කාලය (68.8) අඩු බව ය.**

**ආරෝග්‍ය ශාලා ගණනාවක් ඔස්සේ ප්‍රතිකාර සේවා පවත්වාගෙන යනු ලැබේ. බාහිර රෝගී අංශයන් වෙතින් ඉටු කෙරෙන රෝග විනිශ්චයන්, ප්‍රතිකාර සහ නොමිලේ බෙහෙත් දීම් ප්‍රමාණය විශාල ය.**

ප්‍රජා සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාමත් වැඩිදියුණු කිරීමත් පාරිශ්‍රමිකයන් ගෙන් ආසන්න වශයෙන් 42% කුත් සඳහා ම සෞඛ්‍ය අමාත්‍යංශ වෙන්කිරීම් ප්‍රමාණයෙන් 26% ක් **ශික්ෂණ රෝහල් 20 ක් වෙත ලබා දී ඇත. මෙම ගණයේ සෑම රෝහලක ම නිරැති කාන්තාවන් ගේ ප්‍රමාණය පිරිමිනට වඩා වැඩි ය. මේවායෙහි ප්‍රතිකාර කරනු ලබන බොහෝමයක් රෝග හේතු කොටගෙන මිය යන පිරිමි රෝගීන් ප්‍රමාණය ගැහැනුනට වඩා වැඩි ය.**

අමාත්‍යංශයේ පුනරාවර්තන වියදම්වලින් 14% **ක් මහ රෝහල් සහ මූලික රෝහල් වෙනුවෙන් ද** 22% ක් සේවක වැටුප් වෙනුවෙන් ද වෙන් කරනු ලැබ තිබේ. **ගම්පොල මූලික රෝහල හැර අනෙක් රෝහල්වල සේවකයන් අතර කාන්තාවන් ගේ ප්‍රමාණය පිරිමිනට වඩා වැඩි ය. මෙම ගණයේ රෝහල්වලින් දරුණු රෝග සඳහා ප්‍රතිකාර ලබා පිටව යන කාන්තාවන් ගේ ප්‍රමාණය පිරිමිනට වඩා අඩු ය. ක්ෂයරෝගය (33.5%) වෙනත් ආසාදන රෝග (31.0%) තදබල තුවාල (32.8%) සහ කෘමිනාශක විෂ වීම් (37.0%) සඳහා ප්‍රතිකාර ලබා පිටව යන කාන්තාවන් ගේ ප්‍රමාණය පිරිමිනට වඩා අතිශයින් ම අඩු ය.**

**විශේෂ රෝහල් සහ ප්‍රතිකාර ඒකක-(ආයතන 11 කි.)** වෙත මුළු සෞඛ්‍ය අමාත්‍යංශ වෙන්කිරීම්වලින් 11% ක් 2007 දී ද, 10% ක් 2008 දී ද ලබා දී තිබේ. රිජ්වේ ආර්යා රෝහලේ දී ඇතුළත රෝගීන් 68004 කට ආසන්න ප්‍රමාණයක් ද එහි බාහිර රෝගී අංශයෙන් රෝගීන් මිලියන 853 ක් ද ප්‍රතිකාර ලබා තිබේ. මාතෘ රෝහල්වල දී ඇතුළත රෝගීහු 75000 ක් ඉක්මවන ප්‍රමාණයන් ද, ඒවායෙහි බාහිර රෝගී අංශයන්ගෙන් රෝගීහු 222986 ක් ද ප්‍රතිකාර ලබාගත්හ. ඇස් රෝහලේ දී එම ප්‍රමාණයන් පිළිවෙළින් 13107 සහ 342511 ක් වෙයි. පිළිකා රෝහල හා සම්බන්ධ සංඛ්‍යාලේඛන අනුව එය 26020 ක් සහ 99890 ක් වෙයි. මෙම ගණයේ **මාතෘ සහ ළමා රෝහල්වල දී ඉලක්කගත ප්‍රතිලාභීන් වශයෙන් සැලැකෙන්නේ ගැබිනි මව්වරුන්, මව්වරුන් මෙන් ම ගැහැනු සහ පිරිමි ළමයින් ය.**

**සේවක පාරිශ්‍රමිකයන් සඳහා වෙන් කරන ලද ප්‍රමාණයෙන් 17%ක් විශේෂ රෝහල් සහ ප්‍රතිකාර ඒකක වෙත ලැබේ. ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානය හැරුණු විට ඒවායෙහි කාන්තා සේවක පිරිස ප්‍රමාණයෙන් පිරිමින් ඉක්මවයි.**

ඇතුළත් කෙරෙන රෝගීන් සෑම එක් දහසකින් ම 50 ක් මිය යන බැවින් ඉහළම මරණ අනුපාතය වාර්තා වන්නේ පිළිකා රෝහලෙනි. ඇතුළත් කෙරුණු සෑම රෝගීන් එක් දහසකින් ම 10 දෙනෙක් ළය රෝහලේ දී මිය ගොස් ඇත. ළමා රෝහලට ඇතුළත් කෙරුණු රෝගීන් ගේ මියයෑම් අනුපාතය 1000 කට 6 කි. මන්ද පෝෂණය සහ විටමින් ඌනතාව හේතු කොටගෙන රෝහල්ගත වී සුවය ලබා පිට වන පිරිමි දරුවන් ගේ ප්‍රමාණය ගැහැනු දරුවනට වඩා වැඩි ය. (සෞඛ්‍ය අමාත්‍යංශය 2006).

**ගැබිනි මව්වරුන් මියයාමේ රටාවෙහි සතුටුදායක වෙනසක් සිදු වී ඇති බව නොපෙනේ.** 42422 ක් දරු උපත් 2005 වර්ෂය තුළ මාතෘ රෝහලේ දී සිදු වී ඇති අතර සිදු වන සෑම උපත් 10000 ක දී ම මව්වරු 4 දෙනෙක් මිය ගොස් ඇත. මෙරට මාතෘ මියයාම් අනුපාතය, සිදුවන සෑම සජීවී දරු උපත් එක් ලක්ෂයකට ම 38 ක් ලෙස දැක්වෙයි. ශ්‍රී ලංකාවෙහි මියයාම්වලට සෘජුව හෝ වක්‍රව හෝ බලපාන්නා වූ දරු ප්‍රසූතිය ප්‍රධාන මාතෘ මරණ සාධක අතර 6 වැනි තැන ගනී. අම්පාර, කිලිනොච්චිය සහ බදුල්ල යන ප්‍රදේශවල දී එය 3 වැනි තැනට පත් වෙයි.

## සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ රෝග වළක්වාලීම

සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ රෝග වැළැක්වීම සඳහා මුදල් වෙන් කිරීමෙහි අරමුණ වන්නේ වළක්වා ගතහැකි රෝග ද සෞඛ්‍ය ගැටලු ද වෙනත් ආබාධයන් ද අවම කරගනිමින් ජීවන තත්ත්වයේ දියුණුවක් ඇති කරලීමයි. මෙම ක්ෂේත්‍රය තුළ ලිංගාශ්‍රිතව බෝවන රෝග/ඒඩ්ස් වළක්වාලීමේ වැඩසටහනත් පවුල් සෞඛ්‍ය සංවිධානයත් හා පමණක් සම්බන්ධ වී වැඩ කරන කාන්තාවන් ගේ ප්‍රමාණය 50% ඉක්මවයි. **වසංගත නිවාරණ ඒකකය මැලේරියා මර්ධන ව්‍යාපාරය හා පවුල් සෞඛ්‍ය සංවිධානය යනු රෝග වැළැක්වීමේ සේවාවන් හි ප්‍රධාන වශයෙන් නිරත වන ආයතනයන් වේ.**

### ප්‍රදානයන්

සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යංශය වෙත කරන ලද වෙන් කිරීම්වලින් සියයට 8 කට ආසන්න ප්‍රමාණයක් වූ රුපියල් මිලියන 2827 ක මුදලක් ප්‍රදානයන් සඳහා වැය වෙයි. මෙම වෙන් කිරීම්වලින් 5% ක් තරම් වූ විශාල කොටසක් ප්‍රතිලාභ රටාවන් හි සාධාරණ බව රැකෙන සේ ශුභ සාධන කටයුතුවල යෙදවෙයි. සියයට දෙකකට මඳක් වැඩි ප්‍රමාණයක් රාජ්‍ය ආයතන සහ දායක මුදල් සඳහා ය.

## 2.3 කෘෂිකර්ම හා ගොවිජනසේවා අමාත්‍යංශය

2007 දී රුපියල් මිලියන 14190 ක් ද 2008 දී 17478 ක් ද කෘෂිකර්ම හා ගොවිජන සේවා අමාත්‍යංශය සඳහා වූ අයවැය වෙන් කිරීම් ලෙස ආසන්න වශයෙන් දැක්වේ. මේ වනාහි එම වර්ෂයන් සඳහා වූ සමස්ත පුනරාවර්තන වියදම්වලින් සියයට දෙකකට මඳක් වැඩි ප්‍රමාණයකි.

අමාත්‍යංශ වෙන් කිරීම්වලින් 97% කට ආසන්න ප්‍රමාණයක් වැය වන්නේ සංවර්ධන ව්‍යාපෘතීන් වෙනුවෙන් ය. විමර්ශනයට භාජන වුණු සෑම ආයතනයක ම පාහේ ප්‍රතිලාභ බෙදී යාමෙහි දී කාන්තාවන් වෙත සාධාරණය ඉටු වී ඇති බවක් නොපෙනෙයි. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ පමණක් වෙන්කිරීම්වලින් හතරෙන් එකකට මඳක් වැඩි ප්‍රමාණයක් කාන්තාවන් විසින් පරිහරණය කරනු තැබ තිබිණ. වැටුප් හා වේතන ද අතිකාල හා නිවාඩු දින වේතන ද වශයෙන් ගෙවන ලද සේවක පාරිශ්‍රමිකයන් කෘෂිකර්ම අමාත්‍යංශය සඳහා වූ මුළු වෙන්කිරීම්වලින් 21% වූ අතර එය 2008 දී 2% කින් අඩු කරනු ලැබිණ. එහෙත් 2008 අයවැයෙන් නව පත්කිරීම් වෙනුවෙන් ද වෙන්කිරීම් කරනු ලැබ තිබිණි. සෑම දෙපාර්තමේන්තුවක ම සේවක මණ්ඩලවල කාන්තා නියෝජනය සාධාරණව සිදු වී නොතිබිණි. ඒ අතරින් අඩු ම ප්‍රමාණය නිරීක්ෂණය වූයේ 28% ක කාන්තා නියෝජනයක් තිබුණු අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි ය.

කෘෂිකර්ම හා ගොවිජන සේවා අමාත්‍යංශය සඳහා වූ අයවැය වෙන් කිරීම්වලින් 77% කට වැඩි ප්‍රමාණයක් ප්‍රදානයන් සඳහා වේ. ප්‍රදානයන් ගෙන් 88% කට ආසන්න ප්‍රමාණයක් සංවර්ධන සහනාධාර සඳහා සහ 12% කට ආසන්න ප්‍රමාණයක් රාජ්‍ය ආයතන සඳහා ය. මෙම සහනාධාරයන් ගෙන් වැඩි කොටසක් පරිභෝජනය කරන්නේ පිරිමි ගොවීන් ය. ගොවීන් වෙත දුන් සහනාධාරයන් හි ප්‍රතිලාභ ස්ත්‍රී පුරුෂ සාධාරණත්වයක් සහිතව බෙදී යතැයි අපේක්ෂා කරන ලද නමුදු **කෘෂිකර්මයෙහි ලා දායක වන ස්ත්‍රීන් සංඛ්‍යාව අඩු බැවින් එය අපේක්ෂිත පරිදි ඉටු වී නැත.**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි කාන්තා කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථානය විසින් සංවිධාය කරන ලද **කාන්තා කෘෂිකර්ම කටයුතු පුළුල් කිරීමේ වැඩසටහන** කෘෂිකර්මයෙහි නිරත කාන්තාවන් පිළිබඳව අවධානය යොමු කෙරෙන වැදගත් ව්‍යාපෘතියකි. පළාත් නවයක් තුළ සෑම දිස්ත්‍රික්කයක ම මෙම වැඩසටහන දැනට ක්‍රියාත්මක ය. කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරිනියන් 26 දෙනෙක් දිස්ත්‍රික්ක මට්ටමින් දැනට සේවයෙහි යෙදෙති. දිස්ත්‍රික්ක 17 ක් තුළ කාන්තා කෘෂිකර්ම සංගම් 3588 ක් ද මේ වන විට සංවිධානය කරනු ලැබ තිබේ.

## 3.1 ප්‍රතිපත්තිමය නිර්දේශ

| හඳුනාගැනුණු ගැටලු | ප්‍රතිපත්තිමය නිර්දේශ | ක්‍රියාත්මන කිරීම |
|---|---|---|
| රාජ්‍ය අයවැයට ස්ත්‍රී පුරුෂ දෘෂ්ටිකෝණයක් ආරෝපණය කිරීම සඳහා අවශ්‍ය දත්ත නොමැති වීම | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඔස්සේ අදාළ අමාත්‍යංශයන් වෙතින් ද ප්‍රාදේශීය මට්ටමින් ද ස්ත්‍රී පුරුෂ පදනමින් දත්ත ලබාගෙන නිසි සංසන්දනයන් හා විශ්ලේෂණයන් සහිතව රැස් කර තැබීම | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. මධ්‍යම ආණ්ඩුවේ සහ පළාත් සභාවල අදාළ අමාත්‍යංශ. |
| ජාතික මෙන් ම ප්‍රාදේශීය මට්ටමින් ද ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ගැටලු වෙත ප්‍රමාණවත් අවධානයක් යොමු නොවීම | ගැහැනුන් ද පිරිමින් ද ගැහැනු ළමයින් ද පිරිමි ළමයින් ද වශයෙන් සෑම ව්‍යාපෘතියක ම හා වැඩසටහනක ම ප්‍රතිඵල වෙන වෙන ම ස්ත්‍රී පුරුෂ විශේෂත්වයක් සහිතව විශ්ලේෂණය කිරීම | ස්වාධීන මණ්ඩලයක් හෝ අමාත්‍යංශයට සම්බන්ධ වෙනම ඒකකයක්. |
| අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා අංශයන් හි කාන්තාවන් සඳහා රැකියා අවස්ථාවන් වැඩියෙන් නිර්මාණය වී තිබීම | පර්යේෂණ සහ සංවර්ධන පුහුණු වැඩසටහන් ඔස්සේ මානව ප්‍රාග්ධන සම්පත් වැඩිදියුණු කොට ඒ ඒ පුද්ගලයන් ගේ ඵලදායීතාව වැඩි කිරීමට පියවර ගැනීම | මුදල් අමාත්‍යංශය සහ විෂයට සම්බන්ධ වෙනත් අමාත්‍යංශ. |
| තීරණගන්නා මට්ටම් හි තනතුරුවල කාන්තා නියෝජනය අඩු වීම | රැකියා හිණිපෙළෙහි ඉහළට යමින් තීරණ ගන්නා මට්ටම් වෙත ප්‍රවේශ වීමේ අවස්ථාවන් කාන්තාවන් වෙත වැඩි කර දීම | මෙතෙක් තීරණය කර නැත. |
| රාජ්‍ය සේවකයන් සඳහා වූ දේපොළ ණය ප්‍රදානයේ දී ස්ත්‍රී පුරුෂ විශේෂත්වයක් නොවීම හා එබැවින් ශ්‍රී ලංකාව තුළ පිරිමි ඉඩම් අයිතිය වැඩි වීම | මෙවැනි ණය ලබාගැනීමේ සුදුසුකම් කාන්තාව සතු වන විට ඉඩම් අයිතියට ඇය හවුල් කරගැනීම | රාජ්‍ය සේවකයන් වෙත ණය ලබා දීම ක්‍රියාත්මක කරන ආයතන. |
| අධ්‍යාපන අමාත්‍යංශයේ සේවක මාරු කිරීම් සැලසුමකින් හෝ ඉලක්කයකින් තොරව සිදු වීම | නොමිලේ පෙළ පොත් සහ පාසැල් ඇඳුම් ප්‍රදානයේ දී ස්ත්‍රී පුරුෂ සමතාවක් නොදක්වමින් වැඩි අවශ්‍යතාවකින් යුතු (පවුලේ ආදායම අනුව) ගැහැනු/පිරිමි ශිෂ්‍යයන් වෙත ඒවා ලබා දීම | පළාත් සභා අමාත්‍යංශ. |
| පාසැල්වල ළමා අධ්‍යාපන වැඩසටහන් සඳහා ගැහැනු ළමයින් ගේ සහභාගිත්වය පිරිමි ළමයිනට වඩා අඩු වීම | ප්‍රාථමික අධ්‍යාපනයෙහි ලා ගැහැනු දරුවන් ගේ සහභාගිත්වය අඩු වීමට හේතු සොයා බලා නිසි ප්‍රතිකර්ම යෙදීම | පළාත් සභාවන් හි අධ්‍යාපන අමාත්‍යංශ. |
| පළමු පාසැල් වාරය තුළ දී පෙළ පොත් බෙදා දීමේ ප්‍රමාදය | පෙළ පොත් අඩුවකින් හා ප්‍රමාදයකින් තොරව මුද්‍රණය කරවා ලබා දීමට පියවර ගැනීම | අධ්‍යාපන අමාත්‍යංශය. |
| ආබාධිත දරුවන් සඳහා අධ්‍යාපන අමාත්‍යංශයේ වෙන් කිරීම්වලින් 0.6% ක් පමණක් ලැබීම | මෙම ප්‍රදානයන් වැඩි කර ගැහැනු හා පිරිමි සෑම ආබාධිත දරුවකු ම වෙත සාධාරණ ලෙස අදාළ ප්‍රතිලාභයන් ලැබීමට සැලැස්වීම | අධ්‍යාපන අමාත්‍යංශය සහ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය. |
| පිරිමි කෘෂිකාර්මිකයන් පොහොර ඇතුළු කෘෂි සහනාධාරයන් හි ප්‍රධාන ප්‍රතිලාභීන් වීම | ගොවි සංවිධානයන් හි කාන්තා සාමාජිකත්වය ද කාන්තාවන් සඳහා වූ කෘෂි පුහුණු වැඩසටහන් ද වැඩි කිරීම | කෘෂිකර්ම හා ගොවිජන සේවා අමාත්‍යංශය. |

| | | |
|---|---|---|
| පිරිමි කෘෂිකාර්මිකයන් පොහොර ඇතුළු කෘෂි සහනාධාරයන් හි ප්‍රධාන ප්‍රතිලාභීන් වීම | ගොවි සංවිධානයන් හි කාන්තා සාමාජිකත්වය ද කාන්තාවන් සඳහා වූ කෘෂි පුහුණු වැඩසටහන් ද වැඩි කිරීම | කෘෂිකර්ම හා ගොවිජන සේවා අමාත්‍යංශය. |
| පුරුෂයන් ගේ ගේ ජීවිත කාල නිර්ණය ස්ත්‍රීන්ට වඩා බෙහෙවින් අඩු ය. | ස්ත්‍රීන්ට හා පුරුෂයනට විශේෂ වූ හේතු අනුව සිදු වන මරණ පිළිබඳව රෝහල් සේවාවන් ඔස්සේ සමීක්ෂණයන් හි යෙදෙමින් සුදුසු ප්‍රතිකර්ම යෙදීම | සෞඛ්‍ය අමාත්‍යංශය. |
| පාසැල් නොයන වයසේ දරුවන් ද ළදරුවන් ද ගැබිනි හා කිරි දෙන මව්වරුන් ද අතර මන්දපෝෂණය හා බර අඩුකමක් පැවතීම | ළදරුවන්ට මව්කිරි දීමේ පරිචය ප්‍රවර්ධනය කරවීම. ප්‍රාථමික පන්තිවල ශිෂ්‍යයන් වෙත පෝෂ්‍යජනක දිවා අහාර ලබා දීම ප්‍රවර්ධනය කරවීම ගැබිනි සහ කිරි දෙන මව්වරුන් තුළ පෝෂණ ශක්තිය ඇති කරවීමට පියවර ගැනීම | සෞඛ්‍ය අමාත්‍යංශය සහ අධ්‍යාපන අමාත්‍යංශය. |
| මාතෘමරණ සංඛ්‍යාව අඩු වීමේ ප්‍රවනතාවෙහි දුබලතාව | රෝහල් තුළ සිදු වන මාතෘ මරණවලට හේතූන් සොයා බලා නිසි ප්‍රතිකර්ම යෙදීම. | සෞඛ්‍ය අමාත්‍යංශය. |

## ලිපි දායකත්වය

ආචාර්ය මාසිංහ මහත්මිය ශ්‍රී ලංකාවේ කටුබැද්ද විශ්ව විද්‍යාලයෙන් නාගරික හා ග්‍රාමීය සැලසුම්කරනය පිළිබඳ පළමු ශාස්ත්‍රපති උපාදියද, ඔස්ට්‍රේලියාවේ කැන්බරා ජාතික විශ්ව විදයාලයෙන් ප්‍රජා විද්‍යාව පිළිබඳ දෙවන ශාස්ත්‍රපති උපාදියද, ඔස්ට්‍රේලියාවේ Adelaide විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාදිය ද ලබාගන්නා ලදී.

ආචාර්ය මාසිංහ මහත්මිය දශක දෙකකට ආසන්න කාලයක් පුරා අධ්‍යාපන අංශයෙහි මෙන්ම රාජ්‍ය භාණ්ඩාගාර සේවයෙහි නියුතු වී ඇත. ඇය ස්වාධීන පරීක්ෂකවරියක හා උපදේශිකාවක ලෙස, අධ්‍යාපන අමාත්‍යාංශයේද, භෞතික සැලසුම්කරනය පිළිබඳ දෙපාර්තමේන්තුවෙ සහ නාගරික සංවර්ධන අධිකාරියේද සේවය කොට ඇත. එමෙන්ම බෙලිස්හි (Belize) 2001-2002 වර්ෂයන්හි ජාතික අයවැය සම්පාදනයෙහි ද සමාජභාවී අයවැයක වැදගත්කම පිළිබඳ පළමු අදියරෙහි උපදේශිකාවක ලෙසද කටයුතු කර ඇත.

## සංවාද...

ලාභා'පෙක්ෂාවෙන් තොර වූ හා අපක්ෂපාතී ආයතනයක් වන "පාත්ෆයින්ඩර්" පදනමේ දූත මෙහෙවර වන්නේ ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධනය ආශ්‍රිත ප්‍රශ්න සම්බන්ධයෙන් පර්යේෂණාත්මක අධ්‍යයනයන්හි නිරත වෙමින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, සිවිල් සමාජ කණ්ඩායම් හා පොදු ජනයා අතර එම ප්‍රශ්න පිළිබඳව සංවාද හා අධිවාචනයන් ඇති වීම සඳහා උත්ප්‍රේරක කාර්යභාරයක් ඉටු කිරීමයි. මෙම පදනමේ සංවාද වැඩසටහනේ අරමුණ වන්නේ යෝජිත හා අපේක්ෂිත ඉදිරි නීතිරීති මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා සමාජය වෙත එල්ල විය හැකි විවිධ බලපෑම් ගැන විචාරාත්මක විග්‍රහයන්ට හා වාද විවාදවලට මග පාදා දීමෙන් පාර්ලිමේන්තුව තුළ හා ඉන් පිටත ද ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාපටිපාටියේ ගුණාත්මකභාවය වැඩි දියුණු කරීමයි.

සංවාද වැඩසටහනේ එකලොස්වන පියවර වන මෙම දැනුවත් කිරීමේ සැසි වාරය මගින් "ස්ත්‍රී පුරුෂ සමාජභාවී දැක්මකින් යුතු රජයේ අයවැය සම්පාදනයේ" විග්‍රහයට ලක් කෙරේ. මෙම සටහනට පදනම් වූ විචාරාත්මක ලිපි www.sanvada.org වෙබ් අඩවිය තුළින් ලබා ගත හැක. මෙම ප්‍රකාශනයන්හි දැක්වෙන අදහස් හෝ මතයන් "පාත්ෆයින්ඩර්" පදනමේ අදහස් හෝ මතයන් හා සමග සම්පූර්ණයෙන්ම ගැලපෙන බවට නිගමනය කළ නොයුතු බව සළකන්න.

මෙහි සඳහන් අධිගමනයන් පිළිබඳ ඔබගේ නිර්මාණාත්මක විවේචනයන් සහ/හෝ පසුපෙෂණයන් අප වෙත සපයන මෙන් අපි කාරුණිකව ඉල්ලා සටිමු.

පාර්ලිමේන්තුවෙන් පිටත සිදු වන පොදු සාකච්ඡා හා වාද විවාද වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අප සමග එක්ව කටයුතු කරන ලෙස අපි ඔබ වෙත ආයාචනය කර සිටිමු එසේ කිරීම තුළින්, ආර්ථික ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ මෙන්ම මෙරට දේශපාලනමය, ආර්ථිකමය හා ව්‍යාපාරික ක්ෂෙත්‍රයන් තුළ ද යහපත් වෙනසක් සිදු කිරීමට අපට හැකි වනු ඇත.


"පාත්ෆයින්ඩර්" පදනම

දුරකථන අංකය | 2596281
ෆැක්ස් අංකය | 2595894
ඊමේල් | info@pathfinderfoundation.org
වෙබ් අඩවිය | www.sanvada.org
www.pathfinderfoundation.org



සංස්කරණ සහාය: අමීරා කරීම් මිය, ව්‍යාපෘති කළමනාකාරිණිය.